# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## අධ්‍යාපනවේදී උපාධිය II වසර - දෙවන සෙමෙස්තරය - 2018

## BED 3103 - තුලනාත්මක අධ්‍යාපනය

**පැය තුනයි (03)**

**පළමුවැනි කොටසේ සියලුම ප්‍රශ්නවලට ද දෙවන කොටසින් ප්‍රශ්න හතරකට ද (4) පිළිතුරු සපයන්න.**

---

### I - කොටස

1. ගුරු ගෙදරින් ලබාදුන් අවිධිමත් අධ්‍යාපනය කුමක්ද? (ලකුණු 5)

2. සීගිරි ගී අධ්‍යයනය කිරීමේදී එකල තිබූ විධිමත් අධ්‍යාපනය පිළිබඳව ගම්‍ය වන අදහස කුමක්ද?

   (ලකුණු 5)

3. අ.පො.ස. (සා.පෙළ) විභාගය අසමත් වූ සිසුන් සඳහා 2017 වසරේදී හඳුන්වා දුන් නව විෂය ධාරාව බෙදනු ලබන කොටස් දෙක ලියා දක්වන්න.

   (ලකුණු 5)

4. අමෙරිකානු k-12 අධ්‍යාපනය තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ පහක් ලියා දක්වන්න.

   (ලකුණු 5)

5. චීන අධ්‍යාපන පද්ධතිය තුළ දැකිය හැකි ගැටළු පහක් කෙටියෙන් විමසන්න.

   (ලකුණු 5)

6. ශ්‍රී ලංකාවේ තරුණ අසහයනයට ඉදිරිපත් කර ඇති අධ්‍යාපනික විසඳුම් පහක් දක්වන්න. (ලකුණු 5)

7. සංවර්ධිත රටවල් තාක්ෂණය අධ්‍යාපනයට යොදා ගන්නා ආකාරය නිදසුනක් මගින් කෙටියෙන් දක්වන්න. (ලකුණු 5)

8. සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින සම අධ්‍යාපන අයිතිවාසිකම් පිළිබඳ ගැටලුවට අදාළ නිදසුනක් දක්වන්න. (ලකුණු 5)

## II කොටස

9. ලංකාවේ අනුරාධපුර හා පොළොන්නරුව යුගය දක්වා පැවති සම්භාව්‍ය විශ්වවිද්‍යාල පිළිබඳව විවරණය කරන්න.

(ලකුණු 15)

10. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිසා ලංකාවේ පසුකාලීන ඇතිවූ පිබිදීම පැහැදිලි කරන්න.

(ලකුණු 15)

11. I. 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාවේ වැදගත් අංග මොනවාද?

(ලකුණු 8)

II. 1998 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් සිදුකළ නව වෙනස්කම් දක්වන්න.

(ලකුණු 7)

12. I. චීන අධ්‍යාපන බලධාරීන් විසින් 21 වන සියවසට ගැලපෙන පරිදි එරට අධ්‍යාපන පද්ධතිය වෙනස් කිරීම සඳහා මෑත දශක වල හඳුන්වා දුන් සුවිශේෂී ප්‍රතිසංස්කරණ සාකච්ඡා කරන්න. (ලකුණු 7)

II. මෙකී ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාව වැනි රටකට කෙතෙක් දුරට යොදා ගත හැකිද යන්න විමසන්න. (ලකුණු 8)

13. I. 1944 දී හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට පෙර බ්‍රිතාන්‍යයේ පැවති අධ්‍යාපන ආර්ථික හා සාමාජීය තත්ත්වය කෙටියෙන් විවරණය කරන්න.

(ලකුණු 7)

II. ඉහත සඳහන් ප්‍රධාන ප්‍රතිසංස්කරණ සාකච්ඡාවට ලක්කොට එමගින් එරට ප්‍රජාවට අත් වූ වාසි පැහැදිලි කරන්න. (ලකුණු 8)

14. I. තරුණ අසහනයට අධ්‍යාපනය පසුබිම් වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 7)

II. ස්ත්‍රී පුරුෂ බව සමකාලීන ගැටලුවක් වී ඇති ආකාරය හඳුන්වා අධ්‍යාපනය තුළින් ඒ සඳහා ගත හැකි විසඳුම් මාර්ග පෙන්වා දෙන්න.

(ලකුණු 8)

15. I. අධ්‍යාපනයේ ආර්ථික වටිනාකම තක්සේරුකරන දෘෂ්ටිකෝන තුලනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 7)

II. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා ආර්ථිකය අතර සබඳතාවේදී පැනනගින ගැටලු පර්යේෂණ අනාවරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

16. I. සමාජයේ ගැටලු විසඳීම සඳහා බහු සංස්කෘතික අධ්‍යාපනයෙහි වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 7)

II. විවිධ ජනවර්ග අතර සහයෝගිතාව සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළින් ගෙන ඇති පියවර නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 8)

○o○o○o○o○o○o